# සමූපකාර - ණය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ මාර්ගෝපදේශයන්ට අනුකූලව, SDB බැංකුව විසින් ඔබට අවශ්‍ය සහ සුදුසු බැංකු නිෂ්පාදන සහ සේවාවන් තෝරා ගැනීමට ඔබට සහය වීම සඳහා ප්‍රධාන කරුණු ලේඛන මාලාවක් (KFDs) සකස් කර ඇත. මෙම KFD මගින් පුද්ගලික බැංකුකරණය සඳහා පවතින ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ ඇතුළුව විවිධ වර්ගයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පිළිබඳ සාමාන්‍ය දළ විස්තරයක් ගෙනහැර දක්වයි. කෙසේ නමුත් මෙම KFD හි සපයා ඇති තොරතුරු නීතිමය සහ නියාමන වෙනස්කම්වලට මෙන්ම මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් යාවත්කාලීන කිරීම සිදුවිය හැකි බව කරුණාවෙන් සලකන්න. ඔබට වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය නම් කරුණාකර 011 5 411 411 යන අපගේ පැය 24 ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය හරහා හෝ www.sdb.lk වෙබ් අඩවිය ඔස්සේ අප සමග සම්බන්ධ වන්න. ඔබට ඔබගේ ගිණුම් සම්බන්ධයෙන් යම් ආකාරයක පැමිණිල්ලක් සිදුකිරීමට අවශ්‍ය නම්, කරුණාකර පැමිණිල්ලෙ විස්තර සහිත කෙටි ප්‍රකාශයක් SDB බැංකු පීඑල්සී, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06 හි ඇති පැමිණිලි විසඳීමේ නිළධාරී වෙත යොමු කරන්න. නැතිනම් [+94(0) 11 5 411 411] දුරකථනයෙන් හෝ [customercare@sdb.lk] විද්‍යුත් තැපෑලෙන් අප සමග සම්බන්ධ වන්න. එවිට අප ඔබට ඉතා ඉක්මනින් ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුම පිළිබඳ විස්තරය | ගණුදෙනුකරුවන්ට හිමිවෙන ප්‍රතිලාභ | පොලී අනුපාත වර්ග | අනුපාත සංශෝධන වාර ගණන | ගාස්තු වර්ග සහ අනිකුත් බැංකු අයකිරීම් | ගිණුමක් ආරම්භ කිරීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය (සුදුසුකම්/ අවශ්‍ය ලියවිලි/ ඉල්ලුම් කරන ආකාරය) | ප්‍රධාන නීතිරීති සහ කොන්දේසි |
|---|---|---|---|---|---|---|
| සමූපකාර ණය | 1. CBSL ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය මගින් අඩු පොලී අනුපාතයකට ණය ලබාගැනීම.<br>2. නැවත ණය ලබා දීමෙන් ආන්තික ලාභයක් ඉපයීමේ හැකියාව<br>3. සමිතියේ ශේෂ පත්‍රය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කිරීමේ අවස්ථාව<br>4. සාමාජිකයන්ගේ තැන්පතු භාවිතා නොකර අලුත් ව්‍යාපෘති ආරම්භ කිරීමේ හැකියාව<br>5. සමිතියේ ද්‍රවශීලිතාව ආරක්ෂා කරගැනීමට හැකිවීම | ප්‍රතිමූල්‍යකරණය - ස්ථාවර<br>ස්වයං අරමුදල් - පාවෙන / ස්ථාවර | 1. ප්‍රතිමූල්‍යකරණය - CBSL මාර්ගෝපදේශයන්ට අනුව<br>2. ස්වයං අරමුදල් මාසික | 1. ලිපි ද්‍රව්‍ය ගාස්තු<br>2. CRIB ගාස්තු<br>වැඩි විස්තර දැනගැනීමට කරුණාකර අදාළ වාර්තාව කියවන්න. | 1. SDB බැංකුවෙන් ණය ලබාගැනීම සඳහා සමූපකාර සමිති, ගොවි සමිති වැන නීත්‍යානුකූලභාවයක් සහිත ඕනෑම සමිතියක් සුදුසුකම් ලබයි. ඒ සඳහා යම් අදාළ බලයලත් අධිකාරියක් විසින් නිකුත් කළ ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් ණය ලිපිගොනුව සමග ඉදිරිපත් කළ යුතුයි.<br>2. සමිතියේ ගිණුම බැංකුවක පිළිගත හැකි එකක් විය යුතු අතර එය පිළිගත හැකි ආකාරයෙන් පවත්වාගෙන යා යුතුය. එමෙන්ම පරීක්ෂණ නිළධාරීට සෑහීමකට පත්විය හැකි ආකාරයෙන් මූල්‍ය වාර්තා, මූල්‍ය ගනුදෙනු ප්‍රකාශන, මුදල් පොත්, පුද්ගලික මෙන්ම සාමාන්‍ය ලේඛන පවත්වා ගෙන යා යුතුය. පරීක්ෂණ නිළධාරියාගේ නිරීක්ෂණවලදී මෙය විශේෂයෙන්ම නිරූපණය විය යුතුයි.<br>3. සමිතියෙ ණය තොරතුරු කාර්යංශයේ වාර්තාව, බැංකු ණය ප්‍රතිපත්තියට අනුකූලව පිළිගත හැකි විය යුතු වේ.<br>4.අවසාන මූල්‍ය වර්ෂ 3 සඳහා වූ මූල්‍ය වාර්තා එහි සටහන් සමග ඉදිරිපත් කළ යුතු අතර, විගණන දෙපාර්තමේන්තුව විසින් අවමයෙන් වසරක් හෝ විගණනය කර තිබෙන බවට සමිතිය විසින් තහවුරු කළ යුතුය. (ලඝු සටහන් තැබීමේ සහතික පිටපත,වැනි දේ...) එමෙන්ම අදාළ ගිණුම සමිතිය විසින් පසුගිය අවසන් වසර 2 සඳහා ඉදිරිපත් කර තිබිය යුතුය.<br>ආසන්න වශයෙන් වසර 3ක් ඇතුළත විගණනයක් සිදුවී නොමැති නම් පහත දැක්වෙන කරුණු සම්පූර්ණ කළ යුතුය.<br>a. සමිතියේ අදාළ ගිණුම විගණනය සඳහා ඉදිරිපත් කර තිබෙන බවට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තහවුරු කිරීම හෝ සමූපකාර දෙපර්තමේන්තුවේ නිළධාරියෙකු විගණනය සඳහා සමිතියට පැමිණි බව තහවුරු කිරීම. හෝ<br>b. බැංකුව විසින් පිළිගත් ගිණුම්කරණ ආයතනයක්/ ගණකාධිකාරීවරයෙක් විසින් විගණනය කරන ලද විගණන වාර්තාව සහ නිගමනය ඉදිරිපත් කිරීම.<br>5. විගණන වාර්තාවේ කිසිදු අහිතකර ආකාරයේ විගණන නිගමනයක් නොතිබිය යුතු අතර, එවැනි දේ තිබේ නම් ඒවා නිවැරදි කළ හැකි පිළිගත හැකි සැලසුම් SDB බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු වේ.<br>6. ණය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ අවසාන මූල්‍ය වර්ෂයේ සිට මාස 6ක කාලයක් ගෙවී ඇති විට, එම කාලය සඳහා ද මූල්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතුය. විගණනය නොකරන ලද එම සියලුම ගිණුම් බැංකුවට පිළිගත් හැකි නිසි ආකාරයෙන්, සමිතියේ බලයලත් නිළධාරීන් විසින් සහතික කළ යුතුය.<br>7. NPL ratio අනුපාතය 10% ට අඩු හෝ සමාන විය යුතු අතර සමිතිය විසින් NPL වාර්තාව සවිස්තරාත්මකව ඉදිරිපත් කළ යුතුය.<br>8. අධ්‍යක්ෂ මණ්ඩලය ලබාගන්නා ණය ප්‍රමාද නොවිය යුතු අතර, කමිටුව විසින් සමිතියෙන ලබාගන්නා ණය ප්‍රමාණය සම්පූර්ණ ණය ශේෂයෙන් 20% නොඉක්ම විය යුතුය.<br>9. යෝජිත මූල්‍ය පහසුකමේ අවසාන ණය ගැතියන් වන සාමාජිකයන් විසින් ලබාගෙන තිබෙන ණය මුදල, ණය සඳහා අයදුම් කරන අවස්ථාව වන විට කල් ඉක්මවා නොතිබිය යුතු වේ.<br>10.සාමාජිකයන් සඳහා ණය ලබාදීමේදී එක් සාමාජිකයෙකුට ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණය, තනි පුද්ගප උපරිම ණය සීමාවට හෝ උපරිම පුද්ගලික ණය සීමාවට වඩා අඩුවන අතර එය සමිතිය විසින් ආසන්නතම දිනයකදී ඉදිරිපත් කරන ලද ශේෂ පත්‍රයේ දක්වා ඇති පරිදි ණය ශේෂයෙන් 5%ක් දක්වා උපරිමයකි. පුද්ගලික ඇපකරු සීමාව ඉක්මවා ණය ලබාගෙන ඇති විට, ණය සඳහා දේපල උගසට තබා ගන්නේද යන්න පරීක්ෂණ නිළධාරී විසින් තීරණය කළ යුතුය. විශේෂයෙන්ම, අතුරු ව්‍යවස්ථාවේ IMCL පිළිබඳව විශේෂයෙන්ම දක්වා තිබෙන අතර, එබැවින් ණය අයදුම්පත සමග අතුරු ව්‍යවස්ථාවේ සහතික කළ පිටපතක්ද ඉදිරිපත් කළ යුතු වේ.<br>11. සමිතියේ අභ්‍යන්තර පාලන කටයුතු බැංකුවට පිළිගත හැකි තත්ත්වයක පැවතිය යුතුය.<br>a. මාස්පතා මාණ්ඩලික රැස්වීම් පැවැත්විය යුතුය.<br>b. සමිතියට අයත් සේප්පුවක් තබා ගැනීම.<br>c. ගණුදෙනු ද්විත්ව පාලනයක් යටතේ සිදුකිරීම.<br>d. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීම.<br>* සමූපකාර පණත යටතේ ලියාපදිංචි නොවූ සමිතිවල ආසන්නතම වර්ෂයේ මූල්‍ය ගිණුම්, පිළිගත් විගණන ආයතනයක් විසින් විගණනය කළ යුතු වේ.<br>** සමූපකාර පණත යටතේ ලියාපදිංචි සමිති සඳහා පමණක් අදාළයි.<br>*** සමූපකාර පණත යටතේ ලියාපදිංචි නොවූ ගිණුම්, මූල්‍ය වර්ෂයෙන් මාස 6කට වඩා වැඩි වන විට, මාසික පදනමින් මූල්‍ය සාරාංශයක් සැපයීම ප්‍රමාණවත්ය. | 1. ණය නිකුත් කිරීම අදියර වශයෙන් සිදුකෙරෙන අතර, සෑම අදියරයකදීම ණය නිකුත් කිරීමේදී ශාඛා කළමනාකරු විසින් ඊට පෙර අදියරයේ ඵලදායී බව සහතික කළ යුතුය.<br>3. විගණන වාර්තාවේ දෝෂ ඉවත් කර තිබිය යුතුය. |
| මුදල් සීමාව - වාර්ෂික ගෙවීම් | සමිතියේ අවශ්‍යතා සඳහා පහසුවෙන් ණය ලබාගැනීමේ හැකියාව<br>සමිතියේ අවශ්‍යතා සඳහා පහසුවෙන් ණය ලබාගැනීමේ හැකියාව<br>සමිතියේ ශේෂ පත්‍රයට බලපෑමක් නොවන පරිදි ණය ගෙවීමේ හැකියාව | ස්ථාවර | මාසික | ලිපි ද්‍රව්‍ය ගාස්තු | බැංකුවේ ස්ථාවර තැන්පතුවක් පවත්වා ගන්න. | ස්ථාවර තැන්පතු සඳහා මාසික පොලිය - ස්ථාවර තැන්පතුවේ මුදලින් 80% ක්<br>ස්ථාවර තැන්පතු සඳහා වාර්ෂික පොලිය - ස්ථාවර තැන්පතුවේ මුදලින් 90% ක් |

SDB බැංකුව

#ඔබවවටින

සණස සංවර්ධන බැංකුව පීඑල්සී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණයට ලක් කරනු ලබන බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. Fitch Rating BB+ [lka] , Reg. No: PB62PQ